ආරක්ෂක අමාත්‍යාංශය

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

# ඇබෑර්තු

**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පහත දැක්වෙන තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ**

**(1) විද්‍යාඥ (ඉංජිනේරු/ භූවිද්‍යාඥ/ ප්‍රමාණ සමීක්ෂක (Q.S) නගර සැළසුම්කරු/ වෙනත් ප්‍රභේද) (තනතුරු 15යි)**

**බාහිර :**

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාව/ විද්‍යාව/ තාක්ෂණ වේදය පිළිබඳ හෝ සුදුසු විෂය එකතුවක් සමග අදාළ ක්ෂේත්‍රයක වසර හතරක කාලයක ප්‍රථම උපාධියක්

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විද්‍යාව හෝ සුදුසු විෂය එකතුවක් සමග අදාළ ක්ෂේත්‍රයක වසර තුනක කාලයක ප්‍රථම උපාධියක්

**සහ**

ඉංජිනේරු විද්‍යාව/ විද්‍යාව/ තාක්ෂණවේදය පිළිබඳ හෝ අදාළ ක්ෂේත්‍රයක වසර තුනක කාලයක පශ්චාත් උපාධියක්/ ඩිප්ලෝමාවක්

අදාළ ක්ෂේත්‍රයක ආශ්‍රිත සාමාජිකකත්ව

තනතුරට අදාළ පර්යේෂණ පළපුරුද්ද අමතර වාසියකි.

**(2) ප්‍රවෘත්ති නිලධාරී JM 1-1,Gr ii (තනතුරු 01යි)**

**බාහිර :**

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් තනතුරට අදාළ විෂය පරාසයක් සමග විද්‍යාව/ තාක්ෂණ වේදය පිළිබඳ ප්‍රථම උපාධිය

**හෝ**

තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ තොරතුරු සන්නිවේදන තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාව හෝ NVQ 6 තලයට නොඅඩු සමාන සුදුසුකම් සහ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනය වසර පහක (05) පළපුරුද්ද

**හෝ**

NVQ 5 තලයට නොඅඩු සුදුසුකම් සමග රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්ද

**(3) පරිපාලන නිලධාරී JM 1-1,Gr ii (තනතුරු 01යි)**

**බාහිර :**

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලකින් ලබාගත් රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ මානව සම්පත් කළමනාාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය පරාසයක් සමග උපාධියක් සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරද්ද අමතර සුදුසුකමක් වේ.

**(4) කළමනාකරණ සහකාර (තාක්ෂණ) සිවිල්**
**MA 2-2, Gr-iii (තනතුරු 04)**

**බාහිර**

**සුදුසුකම් :**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම 5ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම හෝ රජයේ කාර්මික විද්‍යාලයකින් ජාතික තාක්ෂණ සහතිකය (NCT) ලබාතිබීම හෝ සමාන සුදුසුකම්.

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක සේවා පළපුරුද්ද අමතර වාසියකි.

**(5) රියදුරු PL-3 Gr. iii (තනතුරු 02යි)**

**බාහිර :**

**සුදුසුකම් :**

උපරිම වාර දෙකකදී, අඩුතරමින් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වීම

මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ, කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ රියදුරු බලපත්‍රය ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) රියපැදවීමේ පළපුරද්ද

**පොදු කොන්දේසි :**

**වැටුප් පරිමාව :**

AR-1,Gr. ii - රු.53,150-1375X10-1910X15-95,550

JM 1-1, Gr. ii - රු. 42,600-10X755-18X1135-70,580

MA 2-2, Gr. iii- රු. 30,310- 300X10-350X7-600X4-710X20- 52360

PL-3, Gr. iii රු. 26,290- 270X10- 300X10-330X10- 350X12- 39,490

(වැටුප් පියවර ආරම්භක වැටුප වේ.)

**වයස් සීමාව :**

AR-1 හා JM1-1- වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරදු45ට නොවැඩි විය යුතුය.

MA-2-2/PL-3 වයස අවුරදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

අභ්‍යන්තර සුදුසුකම්වලට අනුකූලව අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවේ.

**අනෙකුත් වරප්‍රසාද :**

රජය හා මහා භාණ්ඩාගාරය අනුමත කළ පහත දැක්වෙන අනෙකුත් වරප්‍රසාද/ දීමනා ගෙවනු ලැබේ.

- ජීවන වියදම් දීමනාව
- 12% සේ.අ. සහ 3% සේ.භා.අ. දායකත්වය
- වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම හා වාර්ෂික ප්‍රසාද දීමනා
- මාසික කාර්ය සාධන දිරි දීමනා
- දුරකථන දීමනාව, වෛද්‍ය හා ජීවිත රක්ෂණය

රජයේ දෙපාර්තමේනතු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පත් අදාළ සහතික පිටපත් සමග **2024 අප්‍රේල් 05** දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කොළඹ 05.**